# ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

## 2021 **වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම**

2021 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ සහ සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සමඟ ලියාපදිංචි වීමට කැමැත්ත පල කරන රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය ව්‍යාපාර, රාජ්‍ය සංස්ථා, පිළිගත් සැපයුම්කරුවන්, දේශීය නියෝජිතයින්, නිෂ්පාදකයින්, වෙළෙන්දන්, ව්‍යාපාර සංවිධාන සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

එක් එක් කාණ්ඩ වර්ගීකරණයන් සඳහා රු.1000ක ලියාපදිංචි ගාස්තු වෙන වෙනම ගෙවීමෙන් අයදුම්කරුවන්ට කාණ්ඩ එකකට හෝ එකකට වඩා වැඩි ගණනකට ඉල්ලුම් කල හැකිය. සෑම ඉල්ලුම්පතක් සමඟම නැවත ලබා නොදෙන රු .1000ක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් මහජන බැංකුවේ (228 1001 9000 1704) දරණ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය ගිණුමට බැර වන සේ ගෙවා ලබාගත් බැංකු රිසිට් පත හෝ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සරප් කවුන්ටරය වෙත ගෙවා ලබාගන්නා ලද රිසිට්පත එවිය යුතු වේ. බැංකු අණකර , චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන බව කරුණාවෙන් සලකන්න.

සැපයුම්කරුවන් හට අදාළ අයදුම්පත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක. (www.seu.ac.lk) ඊට පටහැනිව එවන ලද අයදුම්පත් භාරගනු නොලැබේ. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කර ඇති ව්‍යාපාර කටයුත්ත සඳහා පමණක් අදාල වන භාණ්ඩ සහ සේවා සැපයීම වෙනුවෙන් ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

ඕනෑම අයදුපතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ. යම් සැපයුම්කරුවෙකු ලංසු කැඳවීම සිදුකරන ලද අඛණ්ඩ අවස්ථාවන් තුන (03) කදී ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වුවහොත් එම සැපයුම්කරුවන්ගේ නාමය 2021 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාමලේඛණයෙන් පූර්ව දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ලැබේ. සාමාන්‍යයෙන් භාණ්ඩ සහ සේවා සඳහා මිළ ගණන් කැඳවීම ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත සිදු කරන නමුත් අනෙකුත් තරඟකාරී අර්පණකරුවන්ගෙන් අවශ්‍ය අවස්ථාවන්හී දී මිළගණන් කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.

2021 වර්ෂය සඳහා ලියාපදිංචි වූ සැපයුම්කරුවන් විසින් දින 45 ක ණය පහසුකම් ලබාදීමට එකඟ විය යුතුය. යම් සැපයුම්කරුවකු ඉහත සඳහන් කොන්දේසිය ලියාපදිංචිවීමෙන් පසුව හෝ කඩ කරයි නම් එවැනි සැපයුම්කරුවන් අසාදු ලේඛන ගත කරනු ලැබේ.

ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්**,** මෑත කාලීනව දේශීය ආදායම් කොමසාරිස්වරයා විසින් සහතික කල එකතු කල අගයමත බදු (VAT) සඳහා ලියාපදිංචි වීමේ සහතිකයේ පිටපතක් (VAT සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවෙකු නම් ), සහ අනෙකුත් අදාල ලියකියවිලි අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය. ඉහත සඳහන් සහතිකපත් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021"ලෙස සඳහන් කර සහකාර මූල්‍යාධිකාරී, සැපයුම් අංශය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල උද්‍යානය, ඔලුවිල් # 32360 යන ලිපිනයට 2020.12.10 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මේ පිළිබඳ වැඩි විස්තර වි**ශ්වවිද්‍යා**ලයේ වෙබ්අඩවියට පිවිසීම මගින් ලබ)ගත හැක. (www.seu.ac.lk)

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය,**
**විශ්වවිද්‍යාල උද්‍යානය, ඔලුවිල් # 32360**